- පහත ඡේදය හොඳින් කිහිප වරක් කියවන්න?

සුනිල් වලව්වේ වත්තට බැස්සේ ය. එහි පේර ගස් දෙකත්,බුලත් වැල ගිය කහට ගසත්,මී කළය තිබුණු කජු ගසත් පැණි වරකාවත් පසු කර පහළට ගියේ ය. වැට අද්දරට ගියේ ය.ඔහු සෙමෙන් සෙමෙන් වැටෙන් පැන්නේය. පැන ඇඹුල් පේර ලන්දට සේන්දු විය.ඇඹුල් පේර ඉදී තිබිණි.ඔහු ලහි ලහියේ එකක් දෙකක් කඩා ගත්තේ ය.කෑවේ ය.ඒවා මී ම මී පැණි රස ය. කලිසන් සාක්කු දෙක ම ඔහු ඇඹුල් පේර වලින් පුරවා ගත්තේ ය. පසු ව කමීසය ඇතුළට ඉහ වටා ඇඹුල් පේර ලා ගත්තේ ය.

(අඹ යහළුවෝ - ටී.බී.ඉලංගරත්න)

1) ඡේදය ඇසුරින් වාචික පිළිතරු ලබා ගන්න
   I. වලව්වේ වත්තේ තිබුණු ගස් මොනවා ද?.....
   .....
   II. සුනිල් කඩා ගත්තේ මොනවා ද? .....
   .....
   III. මී කළය තිබුණේ කුමන ගසේ ද?.....
   IV. ඉදී තිබුණේ මොනවාද? .....

2) පහත සඳහන් වචන ඡෙදයෙන් සොයා රවුම් කරන්න?

වලව්වේ , මී කළය , මී පැණි , ඇඹුල් පේර , පේර ගස , බුලත් වැල ,

3) ගැළපෙන වැකි කොටස් යා කරන්න?

A. බුලත් වැල ගිය	ලන්ද
B. මී කළය තිබුණු	රසය
C. ඇඹුල් පේර	වත්ත
D. වලව්වේ	කජු ගස
E. මී පැණි	කහට ගස